# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 2 ශ්‍රේණිය - පරිසරය( නොවැම්බර්-4 සතිය)

## 15 තේමාව - වටපිටාවේ වෙනස් තැන්.

❖ දුවේ පුතේ වැඩිහිටියෙකුගේ ද උදවු ඇතිව අපි ගෙවත්තේ චාරිකාවකට යමු. අපි ගෙවත්තට යන විට සමාන ප්‍රමාණයේ වතුර බඳුන් දෙකක් ද රැගෙන යමු.

❖ චූටි දුවේ පුතේ දැන් අපි ගෙවත්තෙහි බෑවුමක් ඇති ස්ථානයකට යමු.

❖ ජල බඳුනක් ගෙන එම බෑවුමේ කිසියම් ස්ථානයක සිට පහළට ජලය වත් කර. පසට සිදුවන දේ නිරීක්ෂණය කරන්න.

❖ දුවේ, පුතේ දැන් අපි ගෙවත්තෙහි තැනිතලාවක් ඇති ස්ථානයකට යමු.

❖ අනෙක් ජල බඳුන ගෙන තැනිතලා පොළොව මතට වත්කර සිදු වන දේ නිරීක්ෂණය කරන්න.

❖ දුවේ පුතේ දැන් අපි තැනිතලාව සහිත ස්ථානයෙන් පස් ස්වල්පයක් බඳුනකට දා ගනිමු.

❖ අනෙක් බඳුනට බෑවුම සහිත ස්ථානයෙන් පස් ස්වල්පයක් ගනිමු.

❖ දුවේ පුතේ දැන් අපි විනිවිද පෙනෙන එකම ප්‍රමාණයේ භාජන දෙකක් (හිස් ජෑම් බෝතල්) සොයා ගනිමු. එක් බඳුනකට බෑවුම සහික ස්ථානයෙන් ගත් පස් ද අනෙක් බඳුනට තැනිතලාව සහිත ස්ථානයෙන් ගත් පස් ද, සමාන ව දමා ගනිමු. දැන් දුවේ පුතේ සමාන ප්‍රමානයෙන් ජලය බඳුන් දෙකටම දමා, හොඳින් කලතා පසෙකින් තබා මඳ වේලාවකට පසු බඳුන් දෙකම නිරීක්ෂණය කරන්න. ඔබ දුටු දේ ලස්සනට අඳින්න.

❖ සරුපස් ඇති බඳුන යටින් රතුපාට තරුවක් අඳින්න.

❖ නිසරු පස් ඇති බඳුන යටින් කළුපාට තරුවක් අඳින්න.